විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මාළිගාවත්ත ලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10 மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10


අංකය / இல. / No.: විවැ/ චක්‍රලේඛ/2008 දිනය / திகதி / Date: 2008- 10- 31

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 11/ 2008

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිසාලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ වැටුප සංශෝධනය කිරීම</u>**

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක ආ5/ 1/ 22 හා 2008- 02- 15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/ 2008 හි උපදෙස් පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරමි.

02. ඉහත තීරණ මඟින් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ යම් යම් සේවාවල වැටුප් වැඩි කරනු ලැබ, එසේ වැඩි කරනු ලැබූ වැටුප් පදනම් කරගෙන හිඟ වැටුප් ගෙවීම, වැටුප් වැඩි කරන ලද දිනට පසු දිනක සිට ක්‍රියාත්මක විය යුතු බව දන්වා ඇති අවස්ථාවන්හිදී පහත සඳහන් ක්‍රියාවලිය අනුගමනය කළ යුතු බව දන්වා සිටිමි.

1. සංශෝධනය කරන ලද විශ්‍රාම වැටුප මත ගණන් බලන ලද විශ්‍රාම පාරිතෝෂිකය කලින් ගෙවන ලද විශ්‍රාම පාරිතෝෂිකය අඩු කර හිඟ පාරිතෝෂිකය ගෙවිය යුතුය.

2. සංශෝධිත වැටුප අනුව විශ්‍රාම වැටුප් ගෙවිය යුත්තේ 2008- 06- 01 දින සිටය.

3. විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයේ ප්‍රදානය ගෙවීම ඇරඹිය යුතු දිනය සංශෝධනය නොකර පළමු ප්‍රදාන දිනයම සඳහන් කර වරහන් තුළ හිඟ විශ්‍රාම වැටුප ගෙවන දිනය 2008- 06- 01 දින ලෙස සඳහන් කළ යුතුය. ඒ අනුව, දස අවුරුදු පිරෙන දිනයේ වෙනසක් සිදු නොවනු ඇත.

කේ. පී. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 1. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය
3. විගණකාධිපති


| | Telephone | Fax | | Telephone | Fax | | Telephone | |
|---|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 | |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 | |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 | E-mail: pensions@sltnet.lk |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 | Web site: www.pensions.gov. |